මගේ අංකය : සී1/ASP/පුනරුත්තාපන/පිරිමි - II
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2026.11. 07

මූලස්ථාන අධිකාරි,
සියළුම බන්ධනාගාර අධිකාරීවරුන්,
සහකාර බන්ධනාගාර අධිකාරීවරුන් වෙත.

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සහකාර බන්ධනාගාර අධිකාරි (පුනරුත්තාපන/ පිරිමි) තනතුර සඳහා (අභ්‍යන්තර) බඳවා ගැනීම - 2026

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පවතින සහකාර බන්ධනාගාර අධිකාරි තනතුරෙහි පූරප්පාඩු එකක් (01) ක් සම්පූර්ණ කිරීමට, රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/APP/11/8/13/2026 හා 2026.09.23 දිනැති ලිපියෙන් හා අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශ ලේකම්ගේ අංක MOJ/Prison AD/AD 02/Prom/ASP(Welfare/Male) හා 2026.10.20 දිනැති ලිපි මඟින් අයදුම්පත් කැඳවීම සඳහා අනුමැතිය ලබා දී ඇත. එබැවින් ඔබ ආයතනයේ දැනට සේවයේ නියුතු සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවා 2026.11.23 දිනට පෙර මා වෙත එවීමට කටයුතු කරන ලෙස දන්වමි.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් යොමු කර ඇති සහකාර බන්ධනාගාර අධිකාරි (පුනරුත්තාපන/ පිරිමි) තනතුරෙහි පූරප්පාඩු පිරවීම සඳහා වන අයදුම්පත් කැඳවීමේ නිවේදනය හා අයදුම්පත් ආකෘතිය මේ සමඟ එවන අතර, ඒ සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් දැනුවත් කරන්න.

03. මේ සඳහා අයදුම්පත් යොමු කරන ලද නිලධාරීන් 2026.11.23 දිනට පූර්වාසන්න වසර 05 ක් දක්වා වූ කාලය තුල රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව දඬුවමක් ලබා තිබේද / නැද්ද යන්න ලිපියක් මඟින් දැන්වීමට කටයුතු කරන ලෙසත් මෙයින් දන්වමි.

ආර්. ප්‍රසාද් හේමන්ත කුමාර,
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රා.ආ.)

ආර්. ප්‍රසාද් හේමන්ත කුමාර
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රා.ආ.)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

<u>අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ වන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ</u>

<u>සහකාර බන්ධනාගාර අධිකාරී (පුනරුත්ථාපන - පිරිමි) තනතුර සඳහා</u>

<u>අභ්‍යන්තර බඳවා ගැනීම - 2026</u>

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සහකාර බන්ධනාගාර අධිකාරී (පුනරුත්ථාපන - පිරිමි) තනතුරෙහි පවතින පුරප්පාඩු එකක් (01) ක් අභ්‍යන්තර පදනමින් සම්පූර්ණ කිරීම සඳහා අංක 02 හි සඳහන් සුදුසුකම්ලත් දැනට සේවයේ නියුතු ප්‍රධාන පුනරුත්ථාපන (පිරිමි) නිලධාරින්ගෙන් සහ පළමු පෙළ පුනරුත්ථාපන (පිරිමි) නිලධාරින්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය :- ....2026.11.23.....

සටහන :- අයදුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතු ය.

01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව සහකාර බන්ධනාගාර අධිකාරී (පුනරුත්ථාපන - පිරිමි) තනතුරට බඳවා ගනු ලැබේ.

පත්කරනු ලබන සංඛ්‍යාව සහ පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

02. අවශ්‍ය සුදුසුකම් :

i. අයදුම්පත් කැඳවන අවසාන දිනට ප්‍රධාන පුනරුත්ථාපන (පිරිමි) නිලධාරියෙක් වීම හෝ වසර හයක සේවා කාලයක් සහිත පළමු පෙළ පුනරුත්ථාපන (පිරිමි) නිලධාරියෙක් වීම.

ii. වර්තමාන තනතුරේ සහ පූර්ව තනතුරුවල පූර්වාසන්න වසර 05 ක් තුළ සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

iii. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර 05 තුළ සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

i. මෙම තනතුර සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රාජ්‍ය සේවයේ පත්වීම් සඳහා බලපාන පොදු කොන්දේසි මත, සහකාර බන්ධනාගාර අධිකාරී (සුබසාධක) තනතුර සඳහා වූ බඳවා ගැනීමේ පටිපාටියෙහි කොන්දේසිවලට යටත් විය යුතුය.

(කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/B2/48/01 Vol.ii දරන 2013.09.24 දිනැති ලිපියට අනුව සුබසාධක යන තනතුරු නාමය යන්න "පුනරුත්ථාපන" ලෙස සංශෝධනය වී ඇත.)

ii. මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තවද, වැන්දඹු හා අනත්දරු /වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය. රජය මඟින් විටින්විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

iii. මෙම පත්වීම වසරක පරිවාස කාලසීමාවකට යටත් ය. සහකාර බන්ධනාගාර අධිකාරී (පුනරුත්ථාපන - පිරිමි) තනතුරට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියෙහි සඳහන් පරිදි පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

iv. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ / රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

v. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

04. වයස් සීමාව :

අදාළ නොවේ.

05. වැටුප් පරිමාණය :

2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 10/2025 දරන වැටුප් චක්‍රලේඛයට අනුව මෙම පත්වීමට හිමි මාසික වැටුප් පරිමාණය රු. 82,150–10x2,400–8x2,940–17x3,900-195,970 (SL 1-2025) වේ.

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

අයදුම්කරුවන්ගේ ජ්‍යෙෂ්ඨතාවය සහ කුසලතාවය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගෙන ලකුණු ලබා දෙනු ලැබේ.

අනු අංකය	සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ප්‍රදානය කරනු ලබන ශීර්ෂ	උප ශීර්ෂය යටතේ උපරිම ලකුණු	උපරිම ලකුණු
01.	සේවා පළපුරුද්ද සඳහා		60
	ඉහත අංක 02 ඡේදයේ සඳහන් මූලික සුදුසුකම් සම්පූර්ණ කළ දින සිට අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට තනතුර අනුව බර තැබූ සේවා කාලය පහත පරිදි ගණනය කරනු ලැබේ. (පළමු පෙළ පුනරුත්ථාපන (පිරිමි) නිලධාරි තනතුරෙහි වසර 06 කට වඩා වැඩි සේවා කාලය) + 1.2 x (ප්‍රධාන පුනරුත්ථාපන (පිරිමි) නිලධාරි තනතුරෙහි සේවා කාලය) ඉහත පරිදි ගණනය කරන ලද ඉහළම බර තැබූ සේවා කාලය හිමි අයදුම්කරුට උපරිම ලකුණු ලබා දී, සෙසු අයදුම්කරුවන්ගේ බර තැබූ සේවා කාලයන්ට ඊට සමානුපාතිකව ලකුණු ලබා දෙනු ලැබේ. • සටහන :- මෙහි ‘ සේවා කාලය’ යන්නෙන් සක්‍රීය හා සතුටුදායක සේවා කාලය අදහස් වේ.		

02.	කුසලතාවය සඳහා		40
	1. අධ්‍යාපන සුදුසුකම් සඳහා I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්විද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක් හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත් උපාධියක් සඳහා - ලකුණු 05 II. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජය පිළිගත් ආයතනයකින් හෝ පිරිනමන ඩිප්ලෝමාවක් සඳහා (වසරකට නොඅඩු) - ලකුණු 03 *(උපරිම එක් සුදුසුකමක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)*	05	
	2. ප්‍රශංසා සඳහා බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් දෙනු ලබන ප්‍රශංසාවක් සඳහා ලකුණු 02 • *සටහන : ප්‍රශංසා සඳහා ලකුණු දීමට පොදු 230 b ආකෘතිය අනුව නිබිය යුතුය.*	05	
	3. ක්‍රීඩා ක්‍රියාකාරකම් සඳහා I. ජාතික කණ්ඩායම් නියෝජනය - ලකුණු 05 II. රාජ්‍ය සේවා නියෝජනය - ලකුණු 04 III. දෙපාර්තමේන්තු නියෝජනය - ලකුණු 01 • *සටහන : දෙපාර්තමේන්තු අභ්‍යන්තර නියෝජනය සඳහා ලකුණු ලබා නොදේ.* *(උපරිම එක් සුදුසුකමක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ)* (ප්‍රශංසා සහ ක්‍රීඩා ක්‍රියාකාරකම් සඳහා ලකුණු ලබාදෙනු ලබන්නේ පළමු පෙළ පුනරුත්ථාපන නිලධාරී (පිරිමි) තනතුරට පත්වීමෙන් පසුව ලබා ගත් සුදුසුකම් සඳහා පමණි)	05	
03.	**අනෙක් භාෂා ප්‍රවීණතා සඳහා - සිංහල/දෙමළ/ඉංග්‍රීසි (මව් භාෂාව හැර)** I. රජයේ පුහුණු ආයතනයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් ඩිප්ලෝමාවක් සඳහා (වසරකට නොඅඩු /පැය 1500 කට නොඅඩු) -ලකුණු 05 • *සටහන : ඉහත 02.1.(II) සඳහා අදාළ කර ගත් ඩිප්ලෝමාව හැර වෙනත් ඩිප්ලෝමාවක් විය යුතුය.* II. රජයේ පුහුණු ආයතනයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් සහතිකපත්‍ර පාඨමාලාවක් (වසරකට නොවැඩි සහ මාස 06 කට නොඅඩු/ පැය 720කට නොඅඩු) -ලකුණු 04	05	

	III. රජයේ පුහුණු ආයතනයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පිරිනමන ලද සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා (මාස 06 කට නොවැඩි හා සති 02 කට නොඅඩු/ පැය 360කට නොඅඩු) - ලකුණු 03 IV. රජයේ පුහුණු ආයතනයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පිරිනමන ලද සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා - ලකුණු 02 (සති 02 කට නොවැඩි/ පැය72කට නොඅඩු)		
04.	**පරිගණක සාක්ෂරතාව** I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පිරිනමන ලද ඩිප්ලෝමාවක් හෝ රජයේ පිළිගත් ආයතනයකින් පිරිනමන ලද NVQ 5 හෝ ඊට ඉහළ සුදුසුකමක් සඳහා - ලකුණු 05 • *සටහන : ඉහත 02.1.(II) සඳහා අදාළ කර ගත් ඩිප්ලෝමාව හැර වෙනත් ඩිප්ලෝමාවක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.* II. රජයේ පිළිගත් ආයතනයකින් පිරිනමන ලද සහතික පත්‍ර පාඨමාලාවක් (NVQ 4) සඳහා - ලකුණු 03	05	
05.	ආයතනයේ සුභසාධන, ආගමික හා ක්‍රීඩා ආදී සංගම්වල දරන ලද තනතුරු හා වගකීම් වෙනුවෙන් (එක් තනතුරක් හෝ වගකීමක් සඳහා ලකුණු 02 බැගින්) • *සටහන : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ලිපියක් මඟින් සනාථ කළ යුතු වේ.* (ලකුණු ලබාදෙනු ලබන්නේ පළමු පෙළ පුනරුත්ථාපන නිලධාරි (පිරිමි) තනතුරට පත්වීමෙන් පසුව ලබා ගත් සුදුසුකම් සඳහා පමණි)	10	
06.	පෞරුෂත්වය සහ සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය – නායකත්වය සහ සන්නිවේදන කුසලතා - ලකුණු 02 – ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා පිළිබඳ දැනුම - ලකුණු 02 – වෘත්තීය ආකල්ප - ලකුණු 01	05	
	මුළු ලකුණු		100

07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින්ගෙන් පමණි.

සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය. පසුව ඉදිරිපත් කරනු ලබන ලේඛනවලට ලකුණු ලබා දෙනු නොලැබේ.

. සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු රියදුරු බලපත්‍රය

08. අයදුම්පත් ඉදිරිපත් කිරීම :-

i. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට එනම්,.....දිනට ඉහත සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් මෙම නිවේදනය අවසානයට දක්වා ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතිය අනුව සම්පූර්ණ කර දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් .....දිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ඉදිරිපත් කළ යුතු ය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

09. සාවද්‍ය තොරතුරු සැපයීම.

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඕනෑම අවස්ථාවක පත්වීම අවලංගු කිරීමට කටයුතු කරනු ලැබේ.

10. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

11. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

12. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටළුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණ වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය,

2026.....10.....මස.....19...දින

ජනාධිපති ඒ.කේ.ඩී. අයෙෂා ජිනතිලක
ලේකම්
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

ආදර්ශ අයදුම්පත

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ වන

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සහකාර බන්ධනාගාර අධිකාරී (පුනරුත්ථාපන - පිරිමි) තනතුර සඳහා

අභ්‍යන්තර බඳවා ගැනීම - 2026

01. ඉල්ලුම්කරුගේ නම : -

1.1 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) : .....
..... (මයා/මිය/මෙය)

1.2 මුලකුරු සමඟ නම (සිංහලෙන්/දෙමළෙන්) : .....
.....

1.3 මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්) : .....
.....

1.4 මුලකුරු වලින් හැඳින්වෙන නම (ඉංග්‍රීසියෙන්) : .....
.....

02. ලිපිනය :

2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : .....
.....

2.2 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසියෙන්) : .....
.....

2.3 දුරකථන අංක :- ජංගම : ..... ස්ථාවර : .....

2.4 විද්‍යුත් ලිපිනය :- .....

03. විවාහක / අවිවාහක බව

අවිවාහක - 1
විවාහක - 2 ☐ *(අදාළ අංකය කොටුව තුල ලියන්න.)*

04. ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐

05. වයස :

5.1 උපන් දිනය : අවුරුද්ද ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

5.2 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස (2026/..11./..3.දිනට) :

අවුරුදු ☐☐☐☐ මාස ☐☐ දින ☐☐

06. මුල් පත්වීම් දිනය : .....

තනතුර : .....

සේවය ස්ථිර කරන ලද දිනය : .....

07. පළමු පෙළ පුනරුත්ථාපන නිලධාරී :

7.1 පළමු පෙළ පෙළ පුනරුත්ථාපන නිලධාරී තනතුරට පත්වීම් ලද දිනය : .....

7.2 පළමු පෙළ පුනරුත්ථාපන නිලධාරී තනතුරට අදාළ සේවා කාලය (අයදුම්පත් කැඳවන අවසාන දිනට) : .....

.....

08. ප්‍රධාන පුනරුත්ථාපන නිලධාරී :

8.1 ප්‍රධාන පුනරුත්ථාපන නිලධාරී තනතුරට පත්වීම් ලද දිනය : .....

8.2 ප්‍රධාන පුනරුත්ථාපන නිලධාරී තනතුරට අදාළ සේවා කාලය (අයදුම්පත් කැඳවන අවසාන දිනට) : .....

.....

09. කුසලතාවය :

9.1 අධ්‍යාපන සුදුසුකම් : .....

.....

.....

9.2 ප්‍රශංසා (බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් දෙනු ලැබූ) : .....

.....

.....

9.3 ක්‍රීඩා ක්‍රියාකාරකම් :

	තරඟ ඉසව්ව	ඉදිරිපත් වූ වර්ෂය	ලැබූ ජයග්‍රහණය
ජාතික කණ්ඩායම් නියෝජනය			
රාජ්‍ය සේවා නියෝජනය			
දෙපාර්තමේන්තු නියෝජනය			

10. භාෂා ප්‍රවීණතාවය - සිංහල/දෙමළ/ඉංග්‍රීසි (මව් භාෂාව හැර) :

පාඨමාලාවේ නම	හැදෑරූ ආයතනය	පාඨමාලා වර්ගය		කාලය			
		සහතිකපත්‍ර පාඨමාලාව	ඩිප්ලෝමාව	වසරකට නොඅඩු/පැය 1500 කට නොඅඩු	වසරකට නොවැඩි හා මාස 06 ට නොඅඩු/පැය 720 ට නොඅඩු	මාස 06 ට නොවැඩි හා සති 02 ට නොඅඩු/පැය 360 ට නොඅඩු	සති 02 කට නොවැඩි/ පැය 72 කට නොඅඩු

11. පරිගණක සාක්ෂරතාවය :

පාඨමාලාවේ නම	හැදෑරූ ආයතනය	සුදුසුකම්		
		NVQ 4	NVQ 5	NVQ 5 ට ඉහළ

12. තාක්ෂණික/ වෘත්තීය/ වෙනත් සුදුසුකම් : .....
.....
.....

13. ආයතනයේ සුභසාධන, ආගමික හා ක්‍රීඩා ආදී සංගම්වල දරන ලද තනතුරු හා වගකීම් : .....
.....
.....

14. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් හෝ දෙපාර්තමේන්තු පරීක්ෂණයකින් දඩුවම් ලබා තිබේද ? සහ චෝදනා පත්‍රයක් ලබා දී ඇත්නම් හෝ එම චෝදනාවන් සම්බන්ධව මූලික විමර්ශනයක් ආරම්භ කර ඇත්නම් ඒ පිළිබඳ විස්තර : ඔව් / නැත

"ඔව්" නම් විස්තර සඳහන් කරන්න.
.....
.....
.....

15. පූර්වාසන්න වසර 06 ක් තුළ වැටුප් වර්ධක උපයාගැනීම සහ පූර්වාසන්න වසර 05 ක් තුළ කුසලතාවය පිළිබඳ විස්තරය : (කාර්යසාධන ඇගයීම් වාර්තා සඳහා ලබා ඇති කුසලතා මට්ටම - අදාල කොටුව තුළ ✓ ලකුණ යොදන්න)

වර්ෂය	වැටුප් වර්ධක උපයා ගැනීම		කාර්යසාධන කුසලතාවය			නිවැරදි බවට වි.ලි./ප්‍ර.ලි./පරි.නි. සටහන
	ඇත	නැත	විශිෂ්ඨ	සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ	සතුටුදායක	
2020						
2021						
2022						
2023						
2024						
2025						

16. අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙම අයදුම්පත්‍රයෙහි මවිසින් සපයා ඇති විස්තර සත්‍ය බව ද, නිවැරදි බවද මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් යම්කිසි තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමට ද, මෙම තනතුරට මා පත් කර ගැනීමෙන් පසුව එම වරද අනාවරණය වුවහොත් ඊට අදාල ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඕනෑම අවස්ථාවක පත්වීම අවලංගු කිරීමට ද යටත් වන බව දනිමි.

දිනය : .....

.....
අයදුම්කරුගේ අත්සන

17. දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ සහතිකය :

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ..... මහතා/ මහත්මිය/ මෙනෙවිය මෙම දෙපාර්තමේන්තුවේ ..... ලෙස සේවය කරන බවත්, මෙම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති සියලුම තොරතුරු, නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව සත්‍ය බව හා නිවැරදි බවත්, සහතික කරන අතර ඔහුගේ / ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි.

.....
ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය :
නම :
තනතුර :
ලිපිනය :

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)